**මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2015**

මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2004 ජුනි 16 දින එළඹි අංක 2080 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.06 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාර්ග ජාලය කාර්යක්ෂමව සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,969 කට සමාන එජඩො මිලියන 20 ක් වන අතර ඉන් රු.මිලියන 1476.75 කට සමාන එජඩො මිලියන 15 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2004 සැප්තැම්බර් 15 දින ආරම්භ කරන ලද අතර 2008 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘතියේ කාර්යයන් නිම කිරීමේ දිනය 2015 ජුනි 30 දක්වා වාර 06 කදී දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරනලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 15 | 1,476.75 | 60.00 | 59.36 | 15.49 | 1,793.52 |
| ශ්‍රීලංර | 05 | 492.25 | 41.15 | 40.90 | - | 426.54 |
| | 20 | 1,969.00 | 101.15 | 100.26 | 15.49 | 2,220.06 |

ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා අරමුදල් උපයෝජනය කිරීමට සැලැස්මක් නොමැති වීම හේතුවෙන් එජඩො මිලියන 15 ක් වූ ආරම්භක ණය මුදල් වෙන්කිරීමෙන් එජඩො 144,810 ක වෙන්කිරීම ණය නියෝජිතායතනය විසින් පසුව අවලංගු කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද වැය නොකර අග්‍රිම ගිණුමේ පැවතුණු රු.2,136,446 කට සමාන එජඩො 15,191 ක ශේෂයද 2015 සැප්තැම්බර් 17 දිනට ණය නියෝජිතායතනයට ආපසු ගෙවා තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

ලැබුණු තොරතුරු අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් මාර්ග නියෝජිතායතනවල සහභාගීත්වය සහිතව පුනරුත්ථාපන කාර්යයන් සඳහා ජාතික මාර්ග කිලෝමීටර් 2,200 ක් හා පළාත් මාර්ග කිලෝමීටර් 2,900 ක් ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම සිදු කිරීම සඳහා තෝරා ගෙන තිබුණි. කෙසේ වුවද රු.මිලියන 1,965 ක පිරිවැයකට ජාතික මාර්ග කිලෝමීටර් 3,165 ක් හා පළාත් මාර්ග කිලෝමීටර් 3,119 ක් සැලසුම් කිරීමට උපදේශක සේවා සැපයීම සඳහා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. ඉන් ජාතික මාර්ග කිලෝමීටර් 1,821 ක් හා පළාත් මාර්ග කිලෝමීටර් 3,143 ක් සඳහා ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම් 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. කිරුළපන සිට ඔරුගොඩවත්ත, කිරුළපන සිට කොට්ටාව, නව කැළණි පාලම සිට කඩවත හා නව කැළණි පාලම සිට ගාලු මුවදොර දක්වා මාර්ග කොටස් වැඩිදියුණු කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයේදී, රුපියල් මිලියන 1.47 ක් වටිනා ජංගම නොවන වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය, උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත භාරදී තිබුණද, වත්කම් භාරදීමේ හා භාරගැනීමේ කාර්යයන්වල යෙදී සිටි වගකිව යුතු නිලධාරීන් අදාළ විෂයයන් භාරදීමේ ලැයිස්තුවල අත්සන් කර නොතිබූ බැවින් භාරදීමේ ක්‍රියාවලියේ අව්‍යාජත්වය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

## 3.4 ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම

----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යයන් අවසන් කර තිබුණද, ව්‍යාපෘතියේ වත්කම් හා බැරකම් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට මාරු කිරීමෙන් පසුව වසා දැමීමේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.